*සැ. යු.*- 2015.07.24 දින පළ වූ අංක 1,925 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,926 - 2015 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 818 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - ත්‍රිකුණාමලය, පන්කුලම, මොරවැව දකුණු සිරිගජබා ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2015 ජුනි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 21 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පිස්කල් විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
(පෙර අංක 189, ගාලු පාර, කොළඹ 03)

නඩු අංකය : ........................................පැමිණිලිකරු.
17692/MB

*එදිරිව*

අලුත්ගම ගුරුගේ ලලිතා,
අංක 15, ධීවර නිවාස,
හික්කඩුව.

..............................................විත්තිකාරිය.

*ඉහත නම සඳහන් විත්තිකාරිය වෙතටයි,*

මෙම නඩුවේ පැමිණිල්ලේ වාසියට ඇතුළත් කර ඇති වර්ෂ 2008ක් වූ දෙසැම්බර් මස 02 වැනි දිනැති සමථ තීන්දු ප්‍රකාශය අනුව, පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි, රු. 1,803,159/- ක මුදලක් සහ ඒ මත 2005 ක් වූ දෙසැම්බර් මස 12 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දිනය තෙක් දිනකට 0.09% දක්වා නෛතික පොළිය ද, ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශිත මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් එකී මුළු මුදල මත නෛතික පොළිය සහ තක්සේරු නඩු ගාස්තු ද, විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති උකස් කරන ලද දේපළ සුරක්ෂිත කරමින් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, එකී මුදල් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 02 ක් ඇතුළත විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවටත්, විත්තිකාරිය විසින් එසේ මුදල් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් රිට් ආඥාව ක්‍රියාවේ යොදවා සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන සමග කියවිය යුතු 1949 අංක 6 දරන උකස් ආඥා 49 වගන්තිය ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ පිස්කල් විසින් තහනමට ගන්නා ලෙසටත් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

කෙසේ වුව ද, මෙම නඩුවේ විත්තිකාරිය විසින් පැමිණිලිකරු සමග ඇති කර ගන්නා ලද සමථයේ කොන්දේසි ප්‍රකාර 2009 පෙබරවාරි මාසයේ රුපියල් ලක්ෂ දෙකක මුදලක් ද, ඉන්පසු 2009 අගෝස්තු මාසයේ සිට 2016 පෙබරවාරි දක්වා කාලය ඇතුළත රුපියල් ලක්ෂය බැගින් තවත් රුපියල් ලක්ෂ 14ක මුදලක් ද, වශයෙන් රුපියල් ලක්ෂ 16ක මුදලක් ගෙවීමට එකඟත්වයට පැමිණ තිබුණ ද, විත්තිකාරිය විසින් එකී සමථයේ කොන්දේසි කඩකරමින් පැමිණිලිකරුට ගෙවිය යුතු වාරික මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් විත්තිකාරියට විරුද්ධව ඇස්කිසි නිකුත් කිරීමට අධිකරණ නියෝග කර ඇති බැවින් ද,

තව ද, විත්තිකරු සහ පැමිණිලිකරු අතර ඇති කරගත් සමථය පරිදි විත්තිකරු විසින් රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදලක් ගෙවා ඇති බැවින්, ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 05 වැනි දින සංශෝධිත අධිකාරි පත්‍රය නිකුත් කිරීමට නියෝග කර ඇති බැවින් ද,

එහෙත් ඉහත වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු මුදලෙන් කොටසක් ගෙවා අනෙකුත් මුදල් ගෙවීමට අපොහොසත්ව පැහැර හැර ඇති බැවින් එකී මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර වන නිශ්චල දේපළ වෙන්දේසි කර එම මුදල් අයකර දීම සඳහා කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය ප්‍රකාරව, එකී නිශ්චල දේපළ වර්ෂ 2015 ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දින ප. ව. 1.30ට එකී දේපළ පිහිටි හික්කඩුව, ධීවර නිවාස සංකීර්ණ පරිශ්‍රයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

එම වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුලු ගැණුම් මුදල හෝ ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද, රජයට අයවිය යුතු ගාස්තු ද (ෂවුන් ඩේජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසි දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කිරීමේ ගාස්තු, පුවත් පත් දැන්වීමේ ගාස්තු, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද, පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු මුදල් ද, ලිපිකරු හා සෝෂක ගාස්තු ද, එකී අවස්ථාවේ දී ම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් බාරගනු නොලැබේ.

තව ද, ඉහළම ලංසු තබන්නා ගෙවීම් කළේ මුළු මුදලෙන් 25% ක මුදලක් නම් ඉතිරි 75% ක මුදල දින තිහක් (30) ඇතුළත ගාල්ල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුව යටතේ තැන්පත් කළ යුතු ය.

*උපලේඛනය*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 59ඩී, හික්කඩුව නගරය, හික්කඩුව ග්‍රාම සේවා නිලධාරි වසමේ හික්කඩුවේ පිහිටි කුඩා ගොඩවත්ත නොහොත් කුඩාවෙගොඩවත්ත සහ කුඩා ගොඩපැල බණ්ඩාරවත්ත නොහොත් කුඩාවක්කඩපැල බණ්ඩාරවත්ත නොහොත් බණ්ඩාරවත්ත නම් ඉඩම බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් මහතා විසින් මැන සකස් කරන ලද 1992.10.10 දිනැති අංක 3501 දරන සැලැස්මෙහි දැක්වෙන කැබලි අංක 13 නම් වූ ඉඩමේ *උතුරට* : මෙම ඉඩමේ කැබලි අංක 11 ද, *නැගෙනහිරට* : පාර ද, *දකුණට* : මෙම ඉඩමේ කැබලි අංක 14 ද, *බස්නාහිරට* : එල්. එල්. ඩී. අල්විස් හා තවත් අය හිමිකම් කියන කුඩාගොඩපැල බණ්ඩාරවත්ත නොහොත් කුඩාවක්කඩපැල බණ්ඩාරවත්ත ද යන මායිම් තුළ වූ පර්චස් හතයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 7.5) ක් විශාල ඉඩම සහ එය තුළ පිහිටි වරිපනම් අංක 241/14 දරන ගොඩනැගිල්ල ද සියලු ගහකොළ, පලතුරු සහිත එකී බිම් ද, එහි පිහිටි සියලු ගොඩනැගිලි ද වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සී. 666/56 හි ලියාපදිංචි කර ඇත.

එන්. එස්. ද ඉසඩ්. සිරිවර්ධන,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගාල්ල.

වර්ෂ 2015 ක් වූ ජූලි මස 03 වැනි දින,
ගාල්ල දිසා අධිකරණයේ දී ය.

07-1257

**මිනුවන්ගොඩ දිසා අධිකරණයේ දී ය.**

ගම්පහ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
වලච්චත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

නඩු අංකය :
30/විශේෂ
ස්වභාවය : විශේෂ
වටිනාකම :
රු. 4,65,378

.................................පැමිණිලිකරු.

*එදිරිව*

(1) සුහසිංහ ආරච්චිගේ අමින්ද උෂාන් සුහසිංහ, හේන්පිටගෙදර, මරදගහමුල
(2) සුහසිංහ ආරච්චිගේ අරනෝලිස් අප්පුහාමි හේන්පිටගෙදර, මරදගහමුල
(3) සුහසිංහ ආරච්චිගේ ජගත් රෝහණ සුහසිංහ, හේන්පිටගෙදර, මරදගහමුල

...........................විත්තිකරුවන්.

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2012.10.25 දිනැති නියෝගය ප්‍රකාරව එකී නඩුවේ 01, 02 සහ 03 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයවීමට ඇති රුපියල් හාරලක්ෂ හැටපන් දහස් තුන්සිය හැත්තෑ අට (රු.4,65,378) ක මුදලක් සහ ඒ මත එකී මුදල ගෙවා අවසන් වන දින දක්වා වර්ෂයකට සියයට දහතර (14%) බැගින් පොලියක් ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ එකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් එකී මුදල මත නීතිමය පොලී ද, නඩු ගාස්තු ද, ඇස්කීසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අය කර ගැනීම සඳහා වර්ෂ 2012.12.01 වැනි දින තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වන විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙහි ඔහුට අයත් දේපලෙහි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද, වර්ෂ 2015 ක් වූ සැප්තැම්බර් මස 18 වැනි දින පෙ.ව. 11.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නන්ට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අලුත්කුරු කෝරලේ, දූනගහ පත්තුවේ, හේන්පිටගෙදර පිහිටි දවටගහවත්තේ අංක 03 දරන කැබැල්ල වූ උතුරට පාර සහ අංක 2 සහ 4 දරන කොටස් ද නැගෙනහිරට : අංක 2 සහ 4 දරන කොටස් ද, දකුණට අංක 04 දරන කොටස සහ ඒ. පී. නයිනායකගේ උරුමක්කාරයින්ට අයිති ඉඩමද, බස්නාහිරට : ඒ. පී. නයිනායකගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම සහ පාර ද මායිම් වූ රූඩ් එකයි පර්චස් විසි හතයි දශම පහයි එක (අ. 0, රූ. 01, පර්. 27.51) ක් විශාල ඉඩමට, ඩබ්ලිව්. පී. එස්. වික්‍රමසිංහ බ. මි. තැන විසින් මැන සාදන ලද අංක 1940 සහ 2006.12.08 දින දරන ප්ලෑනය ප්‍රකාර බෙදා වෙන්කර ගත් අංක 03 ඒ දරන කැබැල්ලට මායිම් උතුරට : ප්‍රාදේශීය සභා පාර සහ 1867 පිඹුරේ අංක 02 දරන අඩි 12 පළල පාර ද එකී පිඹුරේ අංක 04 දරන කොටස ද, නැගෙනහිරට : 1867 පිඹුරේ අංක 02 දරන අඩි 12 පළල පාර ද එකී පිඹුරේ අංක 04 දරන කොටස ද දකුණට : 1867 පිඹුරේ අංක 04 සහ 03 බී දරන කොටස් ද, බස්නාහිරට : අංක 03 බී දරන කොටස සහ ප්‍රාදේශීය සභා පාර ද, මායිම් වූ පර්චස් තිස් හතරයි දශම පහයි එකක් (අ. 0, රූ. 0, පර්. 34.51) ක විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ පලතුරු යන ආදී සියලු දේ ද වේ.

එස්. ඩී. එම්. ඩී. ප්‍රනාන්දු,
රෙජිස්ට්‍රාර් පිස්කල්,
දිසා අධිකරණය ගම්පහ.

වර්ෂ 2015 ක් වූ ජූලි මස 06 වැනි දින දී ය.

07-1434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.